### B කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)

5. a) පහත දී ඇති ප්‍රතික්‍රියාව සලකන්න.

$$A(g) + B(g) \underset{k_r}{\overset{k_f}{\rightleftharpoons}} C(g) + D(g)$$

මෙහි $k_f$ හා $k_r$ යනු පිළිවෙලින් ඉදිරිය හා පසු ප්‍රතික්‍රියාවල සීඝ්‍රතා නියතයන් වේ. චාලක විද්‍යාවේ දැනුම භාවිතා කරමින්, සමතුලිතතා නියතය $K_c$ සඳහා ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 2.5)

b) $H_2(g)$ හා $I_2(g)$ 0.48 mol බැගින් ($t_0$ හිදී) 1 $dm^3$ පරිමාවක් සහිත දෘඪ බඳුනක් තුළ 400 K උෂ්ණත්වයේ තබා සමතුලිත වීමට ඉඩ හරින ලදී. එවිට ($t_1$ හිදී) සෑදුණු HI මවුල ගණන මවුල 0.8 විය. මෙම සමතුලිත පද්ධතියට එම උෂ්ණත්වයේදී ම ක්ෂණිකව HI වායුව ($t_2$ හිදී) මවුල 0.4 ක් නික්ෂේපණය කරන ලදී. පසුව එය කාලයත් සමග ගතික සමතුලිතතාවයට පත් වේ. ($t_3$ හිදී)

$$H_2(g) + I_2(g) \rightleftharpoons 2HI(g)$$

i) ආරම්භක සමතුලිත අවස්ථාවේ $K_c$ සොයන්න.

ii) එමගින් එම අවස්ථාවේ $K_p$ සොයන්න.

iii) HI 0.4 mol එකතු කළ අවස්ථාවේ පද්ධතියේ $Q_c$?

iv) එමගින් නව සමතුලිතයේ දිශාව පුරෝකථනය කරන්න.

v) නව සමතුලිතයේ එක් එක් සංඝටකයේ $[H_2]$ , $[I_2]$ , $[HI]$ සොයන්න.

vi) ආරම්භයේ සිට දෙවන සමතුලිත අවස්ථාව දක්වා කාලයත් සමඟ එක් එක් සංරචකයේ සාන්ද්‍රණයේ විචලනය එකම ප්‍රස්ථාරයේ අඳින්න.

ඔබ අඳින ලද ප්‍රස්ථාරයේ එක් එක් අවස්ථාවේ $Q_c$ හා $K_c$ අතර සම්බන්ධය දක්වන්න.




(ලකුණු 5.0)

.22 A/L අපි [ papers grp ].



Scanned with CamScanner

c) $25^{0}C$ පරීක්ෂණාගාරය තුළදී $Ca(OH)_2(s)$ හි ද්‍රාව්‍යතා ගුණිතය නිර්ණය කිරීම සඳහා කළ ක්‍රියා පිළිවෙලක් පහත දී ඇත.

I. NaOH ජලීය ද්‍රාවණයකින් 25.00 $cm^3$ ක් අනුමාපන ප්ලාස්කුවකට ගෙන පිනොප්තලීන් දර්ශකය හමුවේ 0.1 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදී. අන්තලක්ෂයේදී වැය වූ HCl පරිමාව 15.00$cm^3$ ක් විය.

II. ඉහත NaOH ද්‍රාවණයෙන් 100 $cm^3$ ක් බීකරයකට ගෙන එහි වැඩිපුර $Ca(OH)_2(s)$ දියකර සංතෘප්ත ද්‍රාවණයක් (A) සාදාගන්නා ලදී. $25^oC$ දී ඉහත (A) හි උඩුගිය ද්‍රාවණයෙන් 25.00 $cm^3$ ක් අනුමාපන ප්ලාස්කුවකට ගෙන සුදුසු දර්ශකයක් හමුවේ 0.1 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදී. එවිට වැය වූ HCl පරිමාව [illegible].00 $cm^3$ විය.

i) ආරම්භක (I) අනුමාපනයේ අන්තලක්ෂයේදී ඇතිවන වර්ණ විපර්යාසය සඳහන් කරන්න.

ii) ආරම්භක NaOH ද්‍රාවණයේ සාන්ද්‍රණය ගණනය කරන්න.

iii) ඉහත සාදන ලද A ද්‍රාවණය $Ca(OH)_2$ වලින් සංතෘප්ත වී ඇත්දැයි තහවුරු කරගන්නේ කෙසේද?

iv) $Ca(OH)_2(s)$ හි ද්‍රාව්‍යතා ගුණිතය සඳහා ප්‍රකාශනයක් ලියන්න.

v) ඉහත A ද්‍රාවණයේ ඇති මුළු $OH^-$ අයන සාන්ද්‍රණය ගණනය කරන්න.

vi) එම ද්‍රාවණයේ ඇති $Ca^{2+}$ අයන සාන්ද්‍රණය සොයන්න.

vii) ඉහත උෂ්ණත්වයේදී $Ca(OH)_2$ හි Ksp අගය ගණනය කරන්න.

viii) 25 °C NaOH ද්‍රාවණයක් තුළ $Ca(OH)_2$ හි ද්‍රාව්‍යතාව g $dm^{-3}$ වලින් සොයන්න.

ix) $25^oC$ $Ca(OH)_2(s)$ හි ජලයේ ද්‍රාව්‍යතාවත් ඉහත (viii) හිදී ලද ද්‍රාව්‍යතාවත් හේතු සහිතව සසඳන්න.

x) $Al(OH)_3$ හි ද්‍රාව්‍යතා ගුණිතය සෙවීම සඳහා ඉහත ක්‍රමය භාවිතා කිරීමට හැකි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 7.5)

22 A/L අපි [ papers grp ]

6. a) 0.1 mol $dm^{-3}$ $CH_3COOH$ ජලීය ද්‍රාවණයක $25^oC$ දී pH අගය 3.25 ක් වේ.

i) ඉහත ද්‍රාවණයේ $H_3O^+$ සාන්ද්‍රණය සොයන්න.

ii) $CH_3COOH$ හි විඝටන නියතය (Ka) සහ විඝටන ප්‍රමාණය ($\alpha$) ගණනය කරන්න.

iii) 0.1 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක් 500 $cm^3$ තුළ $CH_3COOH$ 0.05 mol දිය කරන ලදී.

I) ද්‍රාවණය තුළ $CH_3COOH$ සාන්ද්‍රණය සොයන්න.

II) 25 °C දී ද්‍රාවණයේ pH අගය සොයන්න.

III) 25 °C දී ඉහත HCl ද්‍රාවණයේ pH අගය ගණනය කර (II) හිදී ලැබුණු අගය සමග සසඳන්න.

(ලකුණු 5.0)

b) 0.1 mol $dm^{-3}$ $CH_3COOH$ 25.00 $cm^3$ ක් අනුමාපන ප්ලාස්කුවකට ගෙන 0.1 mol $dm^{-3}$ NaOH ද්‍රාවණයක් මගින් අනුමාපනය කරන ලදී.

පහත එක් එක් අවස්ථාවේදී ද්‍රාවණයේ pH අගය සොයන්න.

Scanned with CamScanner

i) NaOH, 24.90 $cm^3$ ක් එකතු කර ඇති විට

ii) NaOH, 25.00 $cm^3$ ක් එකතු කර ඇති විට

iii) NaOH, 25.10 $cm^3$ ක් එකතු කර ඇති විට

iv) එකතු කරන ලද NaOH පරිමාව සහ ද්‍රාවණයේ pH අගය අතර දළ ප්‍රස්තාරයක් අඳින්න.

v) පහත දී ඇති දර්ශක ඇසුරින් ඉහත අනුමාපනය සඳහා සුදුසුම දර්ශකය තෝරන්න.

| දර්ශකය | pH පරාසය |
|---|---|
| ෆිනොප්තලීන් | 8.3 - 10.0 |
| මෙතිල් ඔරේන්ජ් | 3.1 - 4.4 |
| මෙතිල් රෙඩ් | 4.2 - 6.3 |

(ලකුණු 4.0)

c) $Al_2O_3$ හි සම්මත දැලිස එන්තැල්පිය ගණනය කිරීම සඳහා දී ඇති එන්තැල්පි සටහන සලකන්න.




i) $\Delta H_1$ සිට $\Delta H_7$ දක්වා එන්තැල්පි විපර්යාසයන් නම් කරන්න.

ii) පහත දැක්වෙන එන්තැල්පි අගයන් සලකන්න.

$\Delta H_1$ = - 1676 kJ $mol^{-1}$

$\Delta H_2$ = 324 kJ $mol^{-1}$

$\Delta H_3$ = 2644 kJ $mol^{-1}$

$\Delta H_4$ = 250 kJ $mol^{-1}$

$\Delta H_5$ = -141 kJ $mol^{-1}$

$\Delta H_6$ = 770 kJ $mol^{-1}$

දී ඇති දත්ත භාවිතා කර $Al_2O_3$ හි සම්මත දැලිස් එන්තැල්පිය ගණනය කරන්න. (ලකුණු 6.0)



Scanned with CamScanner

7\. a) A හා B නම් කෝෂ 2 පහත පරිදි සම්බන්ධ කර විද්‍යුත් විච්ඡේදනය සිදු කරන ලදී.




කෝෂය හරහා 1930 s ක කාලයක් තුළ නියත ධාරාවක් යැවීමේදී A කෝෂයේ ඇනෝඩයේ ස්කන්ධය 1.905 g කින් අඩු වුණු අතර B කෝෂයේ කැතෝඩය මත 3.94 g ක ස්කන්ධයක් තැන්පත් වුණි. B කෝෂයේ ඇනෝඩය අසලින් වායු බුබුළු පිට විය.

i) A හා B කෝෂවල ඇනෝඩය හා කැතෝඩය නම් කරන්න.

ii) එක් එක් ඉලෙක්ට්‍රෝඩය අසලදී සිදුවන අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

iii) කෝෂය හරහා ගලා ගිය විද්‍යුත් ධාරාව සොයන්න.

iv) $M(NO_3)_n$ ලවණයෙහි M හි ආරෝපණය (n) ගණනය කරන්න.

(M = 197  Cu = 63.5  F = 96500 C $mol^{-1}$ )

(ලකුණු 7.0)

b) i) යම් භාණ්ඩයක් මත Ag ආලේප කර ගැනීමට ඔබට අවශ්‍ය වී ඇත. ඒ සඳහා භාවිතා කළ හැකි ඇටවුමක නම් කරන ලද රූප සටහනක් අඳින්න.

ii) 12 $cm^2$ ක වර්ගඵලයක් ඇති සෘජුකෝණාස්‍රාකාර පෘෂ්ඨයක 6 mm ක ඝනකමක් සහිත වන පරිදි Ag ආලේප කිරීමට 5 A ක විද්‍යුත් ධාරාවක් විද්‍යුත් විච්ඡේද්‍ය කෝෂය හරහා යැවිය යුතු කාලය සොයන්න.

(Ag වල ඝනත්වය = 10.5 g $cm^{-3}$ , Ag = 108)

(ලකුණු 2.0)

.22 A/L අපි [ papers grp ]

c) X ආන්තරික ලෝහය මගින් සාදන P නම් ලවණය විසින් සිදු කරන ප්‍රතික්‍රියා සම්බන්ධ ගැලීම් සටහනක් පහත දැක්වේ.






Scanned with CamScanner

i) P ලවණය හඳුනාගන්න.

ii) X හි ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය දෙන්න.

iii) A සිට F දක්වා වූ සංයෝග හඳුනාගන්න.

iv) A, B, C හා D හි වර්ණ සඳහන් කරන්න.

v) ඉහත සටහනෙහි $H_2O_2$ සහභාගි වන ප්‍රතික්‍රියා දෙකට අදාළ තුලිත අයනික සමීකරණ ලියන්න.

vi) P හි ඇති X හි කැටායනය ජලීය මාධ්‍යයේදී සාදන සංකීර්ණ අයනයෙහි ව්‍යුහය, ජ්‍යාමිතිය හා IUPAC නම ලියන්න.

(ලකුණු 6.0)

.22 A/L අපි [ papers grp ]

8. a) $C_6H_5CH_2-OH$ සංයෝගයෙන් ආරම්භ කරමින් F සංයෝගය සංශ්ලේෂණය කිරීමට අදාළ වන ප්‍රතික්‍රියා අනුක්‍රමය පහත දී ඇත.
A, B, C, D සහ E සංයෝගවල ව්‍යුහ ඇඳීමෙන් සහ පියවර 1-6 සඳහා සුදුසු ප්‍රතිකාරක ලැයිස්තුවේ දී ඇති ඒවායින් පමණක් තෝරා ගනිමින් මෙම ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කරන්න.

ප්‍රතිකාරක ලැයිස්තුව :

[PCC , $LiAlH_4$ , තනුක $H_2SO_4$ , $PCl_5$ , Mg/වියළි ඊතර්, KCN , NaBH




(ලකුණු 8.0)

b) i) ආරම්භක කාබනික සංයෝගය ලෙස $C_6H_5NH_2$ භාවිතා කරමින්  යන සංයෝගය සංස්ලේෂණය කරන අයුරු දක්වන්න. (පියවර 6 ට නොවැඩි විය යුතුය)

ii) විජලකාරකයක් භාවිතා නොකර පහත ප්‍රතික්‍රියා පියවර 3 කින් සිදු කරන්න.

1. 


2. $CH_3-CH_2-OH \longrightarrow CH_2=CH_2$

(ලකුණු 4.0)



Scanned with CamScanner

c) i) පහත දැක්වෙන දෑ පැහැදිලි කරන්න.

I. ඇල්කීන සිදුකරන ලාක්ෂණික ප්‍රතික්‍රියා වර්ගය ඉලෙක්ට්‍රොෆිලික ආකලන වන අතර බෙන්සීන් ඉලෙක්ට්‍රොෆිලික ආදේශ ප්‍රතික්‍රියා සිදු කරයි.

II) $Br-CH_2-CH_2-\overset{\overset{O}{\|}}{C}-Br$ යන සංයෝගය $NH_3$ සමග ප්‍රතික්‍රියාවෙන් $Br-CH_2-CH_2-\overset{\overset{O}{\|}}{C}-N_2H$ (ප්‍රධාන ඵලය) හා $N_2H-CH_2-CH_2-\overset{\overset{O}{\|}}{C}-Br$ සුළු ඵලය ලෙස ලබා දේ. මෙම ප්‍රතික්‍රියාව සඳහා යාන්ත්‍රණයක් ඉදිරිපත් කරමින් ප්‍රධාන ඵලය ලැබෙන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 3.0)

.22 A/L අපි [ papers grp ].

9. a) ජලීය ද්‍රාවණයක $CrO_4^{2-}$ , $MnO_4^-$ හා $SO_4^{2-}$ යන අයන පමණක් අඩංගු වේ. ඒවායේ සාන්ද්‍රණය සෙවීම සඳහා පහත ක්‍රියාපටිපාටිය අනුගමනය කරන ලදී.

ජලීය ද්‍රාවණයෙන් 100.00 $cm^3$ ට වැඩිපුර $BaCl_2(aq)$ එකතු කල විට (M) අවක්ෂේපය ලැබුණි. පෙරණයෙන් 25.00 $cm^3$ ක් ගෙන එය සුදුසු පරිදි ආම්ලික කර එයට වැඩිපුර ජලීය KI එකතු කරනු ලැබේ. එම ද්‍රාවණය 1.2 mol $dm^{-3}$ $Na_2S_2O_3$ සමග අනුමාපනයට වැය වූ $Na_2S_2O_3$ පරිමාව 25.00 $cm^3$ විය.

M අවක්ෂේපයට වැඩිපුර තනුක HCl කල විට අවක්ෂේපයෙන් කොටසක් දිය වී ලැබුණු ඉතිරි අවක්ෂේපය (R) පෙරා වෙන් කරගනු ලැබේ. වියළි R අවක්ෂේපයේ ස්කන්ධය 15.3 g විය. R හි පෙරණය ගෙන වැඩිපුර ජලීය KI එකතු කර 1.2 mol $dm^{-3}$ $Na_2S_2O_3$ අනුමාපනයට වැය වූ $Na_2S_2O_3$ පරිමාව 20.00 $cm^3$ විය.

(Mn-55 , Ba-137, S-32, O-16, Cr-52, C-12, K-39, I-127)

i) මෙහිදී සිදුවන සියලුම ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

ii) ආරම්භක ද්‍රාවණයේ ඇති $CrO_4^{2-}$ , $MnO_4^-$ හා $SO_4^{2-}$ යන අයන වල සාන්ද්‍රණ සොයන්න.

(ලකුණු 7.5)

Scanned with CamScanner

b) B ද්‍රාවණයේ ලෝහ කැටායන 3 ක් හා ඇනායන 3 ක් අඩංගු වේ. මෙම අයන හඳුනාගැනීම සඳහා පහත පරීක්ෂා සිදු කරන ලදී.

| | පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|---|
| 1 | • තනුක HCl එක් කරන ලදී.<br>• ආරම්භක ද්‍රාවණයේ කොටසකට වැඩිපුර $BaCl_2$ එක් කරන ලදී. | අවක්ෂේපයක් නැත. අවර්ණ වායුවක් (a) පිට වේ.<br>අවක්ෂේපයක් නැත. |
| 2 | වායුව (a) හුණු දියර තුළින් යවනු ලැබේ. | කිරි පැහැ ද්‍රාවණයක් ලැබී වැඩිපුර වායුව හමුවේ අවර්ණ වේ. |
| 3 | ඉහත (1) හි ලැබෙන ද්‍රාවණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | ද්‍රාවණයේ පැහැය වෙනස් වෙමින් තැඹිලි පැහැති ($P_1$) අවක්ෂේපයක් සමග ආවිලතාවයක් ඇති වේ. |
| 4 | $P_1$ පෙරා වෙන් කරන ලදී. පෙරණයෙන් කොටසකට අලුත පිළියෙල කරගත් $FeSO_4$ 3 ml යොදා සාන්ද්‍ර $H_2SO_4$ සෙමෙන් එකතු කරනු ලැබේ. | දුඹුරු වලයක් ලබාදේ. |
| 5 | පෙරණයෙන් තවත් කොටසක් නටවා, සිසිල් කර, $NH_4Cl$ / $NH_4OH$ එක් කරන ලදී. | සුදු පැහැති ජෙලටිනීමය අවක්ෂේපයක් ලැබුණි. ($P_2$) |
| 6 | $P_2$ පෙරා වෙන් කර පෙරණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | රෝස - කළු අවක්ෂේපයක් ($P_3$) ලැබුණි. |

$P_1$, $P_2$ හා $P_3$ අවක්ෂේප සඳහා පහත සඳහන් පරීක්ෂා සිදු කරන ලදී.

| අවක්ෂේපය | පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|---|
| $P_1$ | $P_1$ අවක්ෂේපය සාන්ද්‍ර HCl හි දියකොට ලැබෙන ද්‍රාවණයට ජලය යොදා තනුක කිරීම. | අවර්ණ ද්‍රාවණය කිරි පැහැ වේ.<br>(1 ද්‍රාවණය) |
| $P_2$ | $P_2$ NaOH යෙදීම | අවර්ණ ද්‍රාවණයක් ලැබුණි. (2 ද්‍රාවණය) |
| $P_3$ | $P_3$ අවක්ෂේපයෙන් කොටසකට තනුක $HNO_3$ එකතු කර පසුව සාන්ද්‍ර $NH_4OH$ වැඩිපුර එක් කරන ලදී. | අවක්ෂේපයක් සහ කහ - දුඹුරු ද්‍රාවණයක් ලැබී පසුව ද්‍රාවණය තැඹිලි පැහැයට හැරෙන අතර අවක්ෂේපය කළු දුඹුරු පැහැයට හැරේ (3 ද්‍රාවණය) |
| | $P_3$ අවක්ෂේපයේ කොටසකට තනුක $HNO_3$ එකතු කර $S_2O_8^{2-}$ **(aq) එකතු කරනු ලැබේ. | දම් පැහැති ද්‍රාවණයක් (4 ද්‍රාවණය) |

** $S_2O_8^{2-}$ යනු ප්‍රබල ඔක්සිකාරකයක් වේ. ($S_2O_8^{2-} \rightarrow 2SO_4^{2-}$)



Scanned with CamScanner

i) B ද්‍රාවණයෙහි ලෝහ කැටායන තුන හා ඇනායන තුන හඳුනාගන්න. (හේතු අවශ්‍ය නොවේ)

ii) $P_1$, $P_2$ හා $P_3$ අවක්ෂේප සහ 1, 2, 3 සහ 4 ද්‍රාවණවල වර්ණයන්ට හේතුවන රසායනික විශේෂ හඳුනාගන්න. (සැ.යු. රසායනික සූත්‍ර පමණක් ලියන්න.)

iii) ද්‍රාවණ 1 හා 2 සිදුවන තුලිත රසායනික ප්‍රතික්‍රියා ලියන්න.

10. a) i) පහත දක්වා ඇති ප්‍රතිකාරක ලැයිස්තුවෙන් සුදුසු ප්‍රතිකාරක තෝරා ගනිමින් ද ඇති සංස්ලේෂණය අවම පියවර සංඛ්‍යාවකින් සිදු කරන්න.



ප්‍රතිකාරක ලැයිස්තුව :

තනුක HCl, සාන්ද්‍ර $H_2SO_4$ , වියළි ඊතර් , HBr , Mg , PCC , $C_2H_5 - O - O - C_2H_5$ , $LiAlH_4$

22 A/L අපි [ papers grp ].

ii) $CH_3 - CH = CH_2$ සංයෝගයෙන් ආරම්භ කරමින් I නම් කාබනික සංයෝගය සංස්ලේෂණය කිරීමට අදාළ ප්‍රතික්‍රියා අනුක්‍රමය පහත දී ඇත. A සිට H දක්වා සංයෝග වල ව්‍යුහ ඇඳීමෙන් සහ 1 සිට 6 දක්වා සුදුසු ප්‍රතිකාරක දී ඇති ලැයිස්තුවෙන් තෝරා ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කරන්න.



ප්‍රතිකාරක ලැයිස්තුව :

තනුක $H_2SO_4$ , $HgSO_4$ , Mg , HBr , වියළි ඊතර,

මධ්‍යසාරීය KOH , $Br_2/CCl_4$

(ලකුණු 7.5)

b) $P(aq) + Q(aq) \rightarrow R(aq) + 2S(aq)$

යන ප්‍රතික්‍රියාවේ චාලක රසායනය අධ්‍යාපනය කිරීම සඳහා 25°C දී පහත පරීක්ෂණ සිදුකරන ලදී. ප්‍රතික්‍රියාවේ වේග නියතය 0.02 $dm^3\ mol^{-1}\ s^{-1}$

පරීක්ෂණ I : සාන්ද්‍රණය 0.4 $mol\ dm^{-3}$ P ද්‍රාවණයෙන් 500 $cm^3$ ක් හා සාන්ද්‍රණය 0.8 $mol\ dm^{-3}$ Q ද්‍රාවණයෙන් 500 $cm^3$ ක් මිශ්‍ර කරන ලදී. තත්පර 15කට පසු ද්‍රාවණයේ P මවුල 0.1 ක් ඉතිරි වී ඇත.

පරීක්ෂණ II : P හි සාන්ද්‍රණය 0.4 $mol\ dm^{-3}$ හි නියතව තබා ගෙන Q හි සාන්ද්‍රණය කාලයත් සමග වෙනස් වන ආකාරය පහත වගු ගත කොට ඇත.

| [Q] / $mol\ dm^{-3}$ | කාලය/s |
|---|---|
| 0.08 | 0 |
| 0.04 | 60 |
| 0.02 | 120 |
| 0.01 | 180 |
| 0.005 | 240 |

i) ඉහත ප්‍රතික්‍රියාවේ P වැය වන සීඝ්‍රතාවත් S සෑදීමේ සීඝ්‍රතාවත් ගණනය කරන්න.

ii) P ට හා Q ට සාපේක්ෂව පෙළ අපෝහනය කරන්න. ඔබේ පිළිතුරහේතු දක්වන්න.

iii) ඉහත ප්‍රතික්‍රියාවට අදාල වේග සමීකරනය ලියන්න.

iv) පරීක්ෂණ II ට අදාළව,

I කාලයට එරෙහිව සාන්ද්‍රණය වෙනස් වන ආකරය දළ ප්‍රස්ථාරයක අඳින්න.

II. ප්‍රතික්‍රියාවේ ආරම්භක සීඝ්‍රතාවය නිර්ණය කරන්න.

(ලකුණු 7.5)

22 A/L අපි [ papers grp ]




Scanned with CamScanner